## ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන
## Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

**සැසිය 2**

**පුනරීක්ෂණය හා ආරම්භයේ සිට 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය දක්වා විෂයමාලා අරමුණුවල විකාශය (Development of Curriculum Objectives)**

**පුනරීක්ෂණයඃ**

- සෘජුව සහභාගී වීමෙන් හෝ දැනටමත් සකස් කර තිබෙන හඬ පටයට සවන්දීමෙන් හෝ ඔබ හඳුනාගෙන තිබෙන **සැසිය 1 අවධානය දැක් වූ මූලික කාරණා** මොනවා ද?
    - මේ සැසි මාලාව කා සඳහා ද යන්න
    - 1999 වර්ෂයේ දී විෂයමාලා සම්පාදනයේ සිදු වූ මූලික වෙනස කුමක් ද යන්න

- 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය එයට පෙර පැවති විෂයමාලා ප්‍රතිසංස්කරණවලට දක්වන සමානකම් හා වෙනස්කම් මොනවා ද?
    - දැනුම, ආකල්ප හා කුසලතා මුල් කර ගත් **ක්ෂේත්‍ර තුනක්** යටතේ විෂය අරමුණු (Subject Objectives) වෙන් වෙන් ව ප්‍රකාශයට පත් කිරීම සමානකමකි.
    - විෂය අරමුණුවලින් ඔබ්බට යමින් මූලික නිපුණතා (Basic Competencies) පහක් සාක්ෂාත් කර ගැනීම සඳහා සිසුන්ට ඉඩකඩ සලසා තිබීම වෙනස්කමකි.

- විෂයමාලා සම්පාදනය සඳහා කාලයක් තුළ යොදා ගත් **අරමුණු ආකෘතියේ** (Objectives Model for Curriculum Development) අවාසි මොනවා ද?
    - පොදු විභාග යටතේ මිනුමට ලක් වන දැනුම **පමණක්** වඩවා ගැනීම සඳහා සිසුන් යොමු වීම
    - දැනුම සමග ආකල්ප හා කුසලතා වඩවා නොගැනීම නිසා හැකියා පූර්ණ පුද්ගලයින් බිහි නොවීම
    - දකුණු මොළය සංවර්ධිත, ක්‍රියාවෙන් ඉගෙනීම ප්‍රිය කරන දරුවන්ට පාසල් අධ්‍යාපනය ජය ගැනීමේ දුෂ්කරතා ඇති වීම

- 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය පෙරට ගෙන ආ **මූලික නිපුණතා** ඔබ හඳුන්වන්නේ කෙසේ ද?

    සන්නිවේදන නිපුණතාව, පරිසර ආශ්‍රිත නිපුණතාව, ආගම හා සදාචාරය පිළිබඳ නිපුණතාව, ක්‍රීඩාව හා විවේකය පිළිබඳ නිපුණතාව හා ඉගෙනීමට ඉගෙනීම පිළිබඳ නිපුණතාව වශයෙන්

- මූලික නිපුණතා, විෂය අරමුණුවලින් වෙනස් වන්නේ කෙසේ ද?
    - විෂය අරමුණු විෂයමාලාවක ඒ ඒ විෂයය අනුව වෙනස් වෙයි.
    - මූලික නිපුණතා විෂයමාලාවේ සියලුම විෂයයන් සඳහා පොදුවේ ක්‍රියාත්මක වෙයි.

**විෂයමාලා අරමුණුවල විකාශය**

1. 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය, එහි සුවිශේෂ ලක්ෂණ ඇසුරින් ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?

- නිපුණතා පාදක (Competency Based),
- ක්‍රියාකාරකම් අභිමුඛ (Activity Oriented),
- ශිෂ්‍ය කේන්ද්‍රීය (Student Centred) ප්‍රයත්නයක් ලෙස.

**2.** 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය ඉගෙනුම් අරමුණු විග්‍රහ කළේ කෙසේ ද?

- විෂයමාලාවක ඒ ඒ විෂයයට සුවිශේෂ විෂය නිපුණතා (Subject Competencies) හා
- විෂයමාලාවක සියලු ම විෂයයන්ට පොදු වූ, පොදු නිපුණතා (Generic Competencies) ලෙස

**3.** විෂයමාලා සැලසුම්කරණ ක්‍රියාවලිය මුල් යුගයේ පැවති අරමුණු ආකෘතියෙන් (Objectives Model), නිපුණතා පාදක ආකෘතියකට (Competency-based Model) පරිවර්තනය වූයේ කෙසේ ද?

- දැනුම, ආකල්ප හා කුසලතා වෙන් වෙන් ව සැලකිල්ලට ලක් කරමින් විෂය අරමුණු ඉදිරිපත් කිරීම වෙනුවට මේවා ඒකාබද්ධ කරමින් **විෂය නිපුණතා (Subject Competencies)** ගොඩනැඟීම
- 1999 විෂයමාලා ප්‍රතිසංස්කරණය ඉදිරිපත් කළ මූලික නිපුණතා පහෙන් බැහැරට යමින් විෂයමාලාවේ සියලු ම විෂයයන්ට පොදු වූ, **පොදු නිපුණතා (Generic Competencies)** පුළුල් වශයෙන් හඳුනා ගැනීම
- පොදු නිපුණතා සමාජ කුසලතා (Social Skills) හා පුද්ගල කුසලතා (Personal Skills) ලෙස වර්ග කිරීම
- චින්තන කුසලතා මතු කර දැක්වීම සඳහා එම කුසලතා, පුද්ගල කුසලතා කාණ්ඩයෙන් වෙන් කර **චින්තන කුසලතා** (Thinking Skills) නම් වූ කාණ්ඩයක් යටතේ වෙනම ම ඉදිරිපත් කිරීම
- මෙසේ ගොඩනඟන ලද පොදු නිපුණතා, විෂය නිපුණතා ද සමග ඉදිරිපත් කිරීම

**4.** ඉගැන්වීම් අරමුණු තීරණය කිරීම පිළිබඳ මෙතරම් දැවැන්ත වෙනසක් නව සහශ්‍රකය ආරම්භයේ දී ඇති වූයේ මන් ද?

21 වන සියවසේ සාර්ථක විය හැකි සමෝධානික පෞරුෂයකින් (Integrated Personality) යුතු පුද්ගලයකු රටට දායාද කිරීමට


**5.** සමෝධානික පෞරුෂයක මූලික සංරචක ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?

- සෞඛ්‍යය (Health), පෝෂණය (Nutrition) හා ශාරීරික සුවතාව (Physical Fitness) මුල් කර සිදු වන **කායික සංවර්ධනය** (Physical Development),
- විෂය නිපුණතා සංවර්ධනයෙන් ඇති වන **බුද්ධිමය සංවර්ධනය** (Intellectual Development),
- පොදු නිපුණතා සංවර්ධනයෙන් ඇති වන **සමාජ සංවර්ධනය** (Social Development) හා **පුද්ගල සංවර්ධනය** (Personal Development)


**6.** සමාජ කුසලතා, පුද්ගල කුසලතාවලින් වෙනස් වන්නේ කෙසේ ද?


- කණ්ඩායම් තුළ කටයුතු කිරීමේ දී **පුද්ගලයින් අතර ගොඩ නැඟෙන කුසලතා, සමාජ කුසලතා (Social Skills)** හෙවත් **අන්තර් පුද්ගල කුසලතා (Inter Personal Skills)** නම් වෙයි.
- ස්වාධීනව කටයුතු කිරීමේ දී **පුද්ගලයින් තුළ ගොඩ නැඟෙන කුසලතා, පුද්ගල කුසලතා (Personal Skills)** හෙවත් **අන්තඃ පුද්ගල කුසලතා (Intra Personal Skills)** වෙයි.

Educational Hierarchy




1






3

## Social Skills/ Inter Personal Skills

- Co-operation
- Collaboration
- Caring
- Sharing
- **Empathetic Listening**
- Communication
  - Receiving Messages
  - Giving Messages
- Leadership & Followership
- Negotiation
- Consensus Building

4

## Personal Skills/
## Intra Personal Skills

- Emotional Balance
- Stress Management
- Initiative
- Change-Orientedness
- **Entrepreneurship**
- Responsibility
- Accountability
- Commitment
- Self-Discipline
- Endurance

5

## Thinking Skills

- Creative Thinking
- Critical Thinking
  - Analytical Thinking
  - **Logical Thinking**
    - Inductive Logic
    - Deductive Logic
- Decision Making
- Problem Solving
- Conflict Management

6

**7.** සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් සමාජ කුසලතා හඳුන්වා දෙන්නේ කෙසේ ද?

- සහයෝගය (Co-operation)
- සහභාගිත්වය (Collaboration)
- අන්‍යයන් කෙරෙහි සැළකිලිමත් වීම (Caring)
- අනුන් සමග බෙදා හදා ගැනීම (Sharing)
- සහානුභූති සවන් දීම (Empathetic Listening)
- සන්නිවේදනය (Communication)
  - පණිවිඩ ලබා ගැනීම (Receiving Messages)
  - පණිවිඩ ලබා දීම (Giving Messages)
- නායකත්වය හා අනුගාමිකත්වය (Leadership and Followership)
- සාකච්ඡාව හා එකඟතාවට පැමිණීම (Negotiation and Consensus Building)

**8.** සහානුභූති සවන් දීම යන සංකල්පය ඔබ අර්ථගන්වන්නේ කෙසේ ද?

**Empathetic listening is the practice of fully understanding and connecting with another person's emotions and perspective through attentive, compassionate, and nonjudgment al listening.**

වෙනත් අය සමග මනා සම්බන්ධතා ඇති කර ගැනීම සඳහා ඒ අයගේ චිත්තවේග (emotions) හා සිතුම් පැතුම් (perspective) මැනවින් තේරුම් ගනිමින්, ඒවාට සම්බන්ධ වීම සඳහා ආධානයෙන් යුතු ව (attentive), කරුණාව පෙරදැරි කර ගෙන (compassionate), විනිශ්චයන්ට නොඑළඹී (nonjudgmental) සිදු කරන සවන් දීමේ පුරුද්දයි.

**9.** සුදුසු නිදසුන් ඉදිරිපත් කරමින් පුද්ගල කුසලතා හඳුන්වා දෙන්නේ කෙසේ ද?

- චිත්තවේග තුලනය කර ගැනීම (Emotional Balance)
- ක්ලමත තත්ත්වයන් කළමනාකරණය කර ගැනීම (Stress Management)
- වෙනස්වීම් සඳහා දිශාභිමුඛ වීම (Change Orientedness)
- ආරම්භනය (Initiative)
- ව්‍යවසායකත්වය (Entrepreneurship)
- වගකීම හා වගවීම (Responsibility and Accountability)
- කැපවීම (Commitment)
- ස්වයං විනය (Self-Discipline)
- දරා ගැනීමේ හැකියාව (Endurance)

**10.** ව්‍යවසායකත්වය යන සංකල්පය ඔබ හඳුන්වන්නේ කෙසේ ද?

පහත සඳහන් ගුණාංගවලින් යුතු වූවකු මූල්‍යමය වූ හෝ සමාජයීය වූ හෝ වටිනාකමක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණෙන් නව අදහසක් පෙරදැරි කර අවදානම් දැරීම

I කුතුහලය (curiosity)

II පරීක්ෂණ කිරීමේ කැමැත්ත (desire to experiment)

III අනුවතර්නය වීමේ හැකියාව (adaptability)

IV ඉක්මණින් ද ඵලදායිව ද තීරණ ගැනීමේ හැකියාව (decisiveness)

V ස්වයං අවබෝධය (self-awareness)

VI අවදානම් දැරීමේ හැකියාව (ability to take risks)

VII පසුබෑම් ඉවසීමේ හැකියාව (tolerance)

VIIIනොපසුබට උත්සාහය / අත් නොහැරීම (persistence)

IX නිමර්ාණශීලි චින්තනය (creative thinking)

X දීඝර්කාලීන එළඹීම (long-term focus)

**11.** සිසුන් තුළ චින්තන හැකියා සංවධර්නය තහවුරු කිරීම සඳහා 2007 විෂයමාලා ප්‍රතිසංස්කරණය කටයුතු කර ඇත්තේ කෙසේ ද?

- සිසුන් චින්තනයට යොමු කරන ශිෂ්‍ය කේන්ද්‍රීය (Student Centred), නිපුණතා පාදක (Competency-Based), ක්‍රියාකාරකම් අභිමුඛ (Activity-Oriented) ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන්
- පුද්ගල සංවධර්නය යටතේ වගර් කර තිබෙන චින්තන හැකියා එම කාණ්ඩයෙන් ඉවත් කර වෙනත් කාණ්ඩයක් යටතේ ඉදිරිපත් කිරීමෙන්
- සියලු ම ක්‍රියාකාරකම්වලට පොදුවේ තක්සේරුව හා ඇගයීම ශක්තිමත් කිරීමෙන්

**12.** සුදුසු නිදසුන් ඇසුරින් චින්තන කුසලතා හඳුන්වා දෙන්නේ කෙසේ ද?

- නිමර්ාණශීලි චින්තනය (Creative Thinking)
- විචාරශීලි චින්තනය (Critical Thinking)
  - විශ්ලේෂණාත්මක චින්තනය (Analytical Thinking)
  - තකර්ානුකූල චින්තනය (Logical Thinking)
    - උද්ගාමී චින්තනය (Inductive Logic)
    - නිගාමී චින්තනය (Deductive Logic)
- තීරණ ගැනීම (Decision Making)
- ගැටලු විසඳීම (Problem Solving)
- ගැටුම් කළමනාකරණය (Conflict Management)

a. හොඳ සාමාන්‍ය අධ්‍යාපනයක් යනුවෙන් ඔබ තේරුම් ගෙන ඇත්තේ කුමක් ද?

b. ජාතික අධ්‍යාපන කොමිසමේ පළමු වාතර්ාවට අනුව සිසුන් වඩවා ගත යුතු වූ අරමුණු අට කවරේ ද?
- බහුවිධ සමාජයක ශ්‍රී ලාංකීය අනන්‍යතාව සුරැකීම
- සංස්කෘතික උරුමය රැක ගැනීම
- සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රීය දිවි පැවැත්ම

**විෂයමාලා සංවධර්නය (Curriculum Development) හා විෂයමාලා ක්‍රියාත්මක කිරීම (Curriculum Implementation) ආශ්‍රිත සංකල්ප හා වගකීම්**

**13. විෂයමාලා චක්‍රය (Curriculum Cycle) යන පදයෙන් ඔබ තේරුම්ගෙන ඇත්තේ කුමක් ද?**

පාසල් විෂයමාලා නවීකරණය හා සම්බන්ධ කටයුතු නිශ්චිත කාල අන්තරක දී සිදු කර ගැනීම සඳහා හඳුන්වා දී ඇති සංකල්පයක්.

**14. ඉහත සංකල්පය ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්‍රමයට හඳුන්වා දුන්නේ කව් ද? කෙසේ ද?**
- 1991 අංක 19 දරන පණතින් බිහි වූ ජාතික අධ්‍යාපන කොමිසම
- වසර් අටක විෂයමාලා චක්‍රයක් හඳුන්වා දීමෙන්

**15. එම සංකල්පය ක්‍රියාත්මක වීම ආරම්භ වූයේ කවදා ද? කෙසේ ද?**
- 1998 වසර්යේ සීමිත මට්ටමින් ක්‍රියාත්මක කිරීම අරඹා 1999 වසර්යේ දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වූ ජා.අ.ආ. හඳුන්වා දුන් විෂයමාලා ප්‍රතිසංස්කරණයක් හරහා

**16. එම සංකල්පය ඉදිරියට ගියේ කෙසේ ද?**

ජා.අ.ආ. 2007 වසර්යේ දී ආරම්භ කළ නව **සහශ්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණය** හා 2015 වසර්යේ දී හඳුන්වා දුන් නව සහශ්‍රකයේ දෙවන විෂයමාලා ප්‍රතිසංස්කරණය හරහා

**17. විෂයමාලා චක්‍රය පිළිබඳ අදහස බිඳ වැටීම ආරම්භ වූයේ කිනම් වසර්වලට අදාළ, කිනම් හේතු නිසා ද?**
- 2023 වසර්යේ දී කොරෝනා වසංගතය හේතුවෙන්,
- 2024 වසර්යේ දී ආථර්ික අබර්ුධය නිසා,
- 2025 වසර්යේ දී නව රජයක් බලයට පත් ව සිටීම නිසා,
- 2026 වසර්යේ දි සිසුන් වෙනුවෙන් සම්පාදිත මොඩියුලවල දෝෂ අනාවරණය වීම නිසා.

**18.** විෂයමාලා සම්පාදනය සම්බන්ධයෙන් ජාතික අධ්‍යාපන ආයතනය යටතේ ක්‍රියාත්මක වන මූලික අංශ දෙක හඳුන්වන්නේ කෙසේ ද?
- භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය (Faculty for Languages, Humanities and Social Sciences)
- විද්‍යා හා තාක්ෂණ පීඨය (Faculty for Science and Technology)

**19.** මේ පීඨ යටතේ ක්‍රියාත්මක වන විෂය දෙපාතර්මේන්තු මොනවා ද?

සිංහල / දෙමළ / ඉංග්‍රීසි / ආගම් / සෞන්දර්ය / සමාජවිද්‍යා (ඉතිහාසය, භූගෝලවිද්‍යාව, පුරවැසි අධ්‍යාපනය) / ප්‍රාථමික අධ්‍යාපනය

**20.** සිංහල හා දෙමළ දෙපාතර්මේන්තු ඉංග්‍රීසි දෙපාතර්මේන්තුවෙන් වෙනස් වන්නේ කෙසේ ද?

භාෂා විෂය දෙක බැගින් සිංහල හා දෙමළ දෙපාතර්මේන්තුවලට පැවරී තිබීම

- මව්බස සිංහල හා දෙවන බස සිංහල,
- මව්බස දෙමළ හා දෙවන බස දෙමළ,
- ඉංග්‍රීසි

**21.** විෂයමාලා සම්පාදනය සඳහා ආගම් දෙපාතර්මේන්තුවට පැවරී ඇති විෂය මොනවා ද?

- බුද්ධ ධර්මය,
- සයිවනේරි ධර්මය (Saivism),
- ඉස්ලාම් ධර්මය,
- කතෝලික ධර්මය හා ක්‍රිස්තු ධර්මය

**22.** සමාජවිද්‍යා විෂය අතර ඔබ දකින වෙනස්කම් මොනවා ද?

හර විෂයයක් ලෙස හඳුනාගෙන ඇති ඉතිහාස විෂයයට සුවිශේෂ ස්ථානයක් හිමිව තිබීම

ජීවන නිපුණතා විෂයය, පුරවැසි අධ්‍යාපන විෂයයට සම්බන්ධ ව කලක් ක්‍රියාත්මක වීම

**23.** ගණිත හා විද්‍යා අධ්‍යාපනය ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වුවත් ප්‍රාථමික අධ්‍යාපන දෙපාතර්මේන්තුව භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය යටතට ගෙන තිබීම

**24.** විද්‍යා හා තාක්ෂණ දෙපාතර්මේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙපාතර්මේන්තු මොනවා ද?

**25.** පුහුණුව (Training) යන පදය, කාලයත් සමග විකාශය වී ඇත්තේ කෙසේ ද?

ගුරු පුහුණු විද්‍යාල මඟින් ක්‍රියාත්මක වූ **ගුරු පුහුණුව**

ගුරු අධ්‍යාපන ආයතන ලබා දුන් **ගුරු අධ්‍යාපනය**

ගුරු සංවර්ධන දෙපාතර්මේන්තු දායකවන **ගුරු සංවර්ධනය**

**26.** ගුරු හා කළමනාකරණ පාශර්වවල වෘත්තීය සංවර්ධනයට කැපවන ජා.අ.ආ. සතු දෙපාතර්මේන්තු මොනවා ද?

- පශ්චාත් උපාධි ගුරු සංවර්ධන දෙපාතර්මේන්තුව (Department for Postgraduate Teacher Development)
- පූර්වසේවා ගුරු සංවර්ධන දෙපාතර්මේන්තුව (Department for Pre Service Teacher Development)
- අඛණ්ඩ ගුරු සංවර්ධන දෙපාතර්මේන්තුව (Department for Continuing Teacher Development)

**27.** ජා.අ.ආ. අරඹන අවස්ථාවේ පැවති ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා වූ උසස් අධ්‍යාපන ආයතනයට අත්පත් වූ ඉරණම කුමක් ද?

**28.** මේ හැරුණ විට ජා.අ.ආ. සතු වෙනත් දෙපාතර්මේන්තු ආවරණය කරන ක්ෂේත්‍ර මොනවා ද?
පයෙර්ෂණ හා සංවධර්න දෙපාතර්මේන්තුව, විශේෂ අධ්‍යාපනය (Special Education), අධ්‍යාපන මාධ්‍ය (Educational Media), වෘත්තීය මාගෙර්ෝපදේශය හා උපදේශන සේවා (Career Guidance and Counselling), අධ්‍යාපන පුස්තකාල සේවාව, විභාග දෙපාතර්මේන්තුව